**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින දීද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
------------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-------------------------

ප්‍රාදේශීය සභාව ඉතිරි තොග අගය කිරීම, මිල කිරීම, ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අංක 252-6362 දරන කැබ් රථයෙහි සිදුකරන ලද අළුත්වැඩියාවන් වෙනුවෙන් රු.497,320 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.451,667 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.196,695 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.16,290 ක් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 **නොසැසඳු පාලන ගිණුම්**
----------------------------

පුරනැගුම ව්‍යාපෘතිය මඟින් ලබාදුන් කාර්යාල උපකරණ රු.966,699 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,581,809 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 13,140,599 ක් විය.

### 1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

රු. 27,495,630 ක් වූ වත්කම් විෂයයන් 02 ක් අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති | සමාලෝචිත වර්ෂයේ රු.281,790 ක් වූ හිඟ කඩ කුලී හා වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු.13,100 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 218 වන රීතිය | 2016 වර්ෂයට අදාලව ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 133 | අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 | වර්ෂ 02 ක් ඉක්මවූ කර්මාන්ත 01 ක අතරුදවුම් රු.13,428 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ සේවකයින් 08 දෙනෙකුගෙන් රු.38,662 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ අංක 09/2009 හා 09/2009(1) චක්‍රලේඛය හා ඌව පලාත් ප්‍රධාන ලේකම්ගේ අංක 03/2016 හා 2016 සැප්තැම්බර් 23 දිනැති චක්‍රලේඛ | සේවකයන් 45 ක් සඳහා සභාව විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,020,808 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,129,421 ක් විය.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2016 ජනවාරි 01 දිනට පැවැති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 54 සිට සියයට 56 දක්වා පරාසයක පැවැතුනි.

2.3.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ප්‍රමාණය රු. 2,256,530 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර වල ව්‍යාපාර කටයුතු කරගෙන යන 17 දෙනෙකුගෙන් රු.184,875 ක හිඟ කඩකාමර කුලියක් අයකරගෙන නොතිබුණි. ගිවිසුම් කාලය අවසන් වූ කඩහිමියන් 12 දෙනෙකු සමඟ නව ගිවිසුම් ඇතිකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් ආයුර්වේදයෙහි අනුමත ඖෂධ සංයෝජක තනතුරේ රාජකාරි ඉටු කිරිම වෙනුවෙන් මාර්ග කම්කරුවකුගේ සේවය ලබා ගෙන තිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

**කුරුවිතැන්න පිට්ටනිය අසල සිට මකුලේමඩ මාර්ගය නඩත්තු කිරීම**

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ 2016 වර්ෂයේ ඉහත මාර්ගයට බොරළු ඇතිරීම සඳහා රු.336,202 ක් වැයකර තිබුණි. මෙම මාර්ගය සඳහා බොරළු ඝනමීටර් 119 ක් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.191,200 ක් ගෙවා තිබූ නමුත් මාර්ගය අසල ඉඩමකින් කපන ලද පස් යොදා මාර්ගය සකස් කර තිබුණි.

3.3 **ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය**

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය සිදු නොකර රැස්කරගනු ලබන කසළ අඳා උල්පත සුසාන භූමියට අක්‍රමවත්ව බැහැර කර තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) ගබඩා පාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) ණයහිමියෝ